# ICCP/SL/OP/245

## ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ළමා මානසික සෞඛ්‍යයට ඇති කරන බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**[1*]Hasintha K**
[1] *කැලණිය විශ්වවිද්‍යාලය*
hasinthakalani572@gmail.com

**පසුබිම :** දකුණු ආසියාතික රටක් වන ශ්‍රී ලංකාව වර්තමානයේ විවිධ අභියෝගවලට මුහුණ දෙනු ලබයි. මෙම අභියෝග අතරින් පවුල් පරිසරය ආශ්‍රිතව පැන නගින්නා වූ ප්‍රධාන අභියෝගයක් ලෙස ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය දැක්විය හැකිය. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වන ඕනෑම අයෙකුට කායික, මානසික හෝ චිත්තවේගීය හානියක් සිදුවිය හැකිය. පවුල් පරිසරය ආශ්‍රිතව සිදුවන ශෝකජනක තත්ත්වයක් වන මෙය දරුවන් හට අතිශය කම්පනයක් සිදුකරන බව පෙන්වාදිය හැකිය. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය අත්විඳින කුඩා හා වැඩිහිටි දරුවන් චිත්තවේගීය, මානසික හා සමාජයීය වශයෙන් හානිදායක තත්ත්වයන් අත්විඳින අතර එය ළමා සංවර්ධනයට ඉමහත් අයුරින් බලපානු ලබයි. ඒ අනුව ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ළමා මානසික සෞඛ්‍යයට ඇති කරන බලපෑම කෙබඳුද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. ගෘහස්ථ හිංසනය නිසා දරුවන්ගේ මානසික සෞඛ්‍යට සිදුවන බලපෑම පරීක්ෂා කිරීම මෙම පර්යේෂණයේ අරමුණ ලෙස දැක්විය හැකිය. මෙම ආකාරයට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය දරුවන්ට ගැඹුරු මානසික බලපෑම් ඇති කරන අතර එය දිගු කාලීන චිත්තවේගීය, සංජානන සහ හැසිරීම් ආදියට බාධා පමුණුවයි. පවුල් ගැටුම් සහ ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වීම තුළ දරුවන් හට කාංසාව, මානසිකව අවපීඩනය, පශ්චාත් කම්පන ආතති ආබාධ (PTSD) සහ සෞඛ්‍ය සම්පන්න සබඳතා ගොඩනගා ගැනීමෙන් දුෂ්කරතා ඇතිවිය හැකිය.

**ක්‍රමවේදය :** මෙම පර්යේෂණය මිශ්‍ර ක්‍රමය යටතේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණයක් ලෙස සිදුකරන ලදී. මෙහිදී දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය යොදා ගන්නා ලදී.

**ප්‍රතිඵල :**ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය දරුවන්ගේ මානසික සෞඛ්‍යයට සංකීර්ණ සහ දීර්ඝ කාලීන බලපෑම් ඇති කරන අතර එමඟින් මානසික ආබාධවලට ගොදුරු වීමේ අවදානම වැඩි වීම, සමාජ සංවර්ධනය අඩාල වීම, ළමුන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලිය ආශ්‍රිතව විවිධ ගැටලු ඇතිවීම හා පෞරුෂ සංවර්ධනය අඩාල වීමද සිදුවන බව මෙම අධ්‍යයනය තුළින් නිගමනය කරයි.

**යෝජනා :** මෙම අධ්‍යයනයේ නිගමන මත පදනම්ව, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක්වන දරුවන්ගේ මානසික සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා නිර්දේශ ලෙස, මානසික සෞඛ්‍ය සේවා ප්‍රවේශය වැඩි දියුණු කිරීම, ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම, පවුල් සහ ප්‍රජා සහාය, නීතිමය සහ ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ, දෙමාපිය-ළමා සබඳතා වැඩිදියුණු කිරීම, දරුවන් සඳහා මනෝවිද්‍යාත්මක උපදේශනය ලබා දීම කෙරෙහි අවධානය යොමු කිරීම, අධ්‍යාපනය සහ දැනුවත් කිරීම යෝජනා කෙරේ.

**මූඛ්‍ය පදඃ** ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, මානසික සෞඛ්‍යය, ළමා සංවර්ධනය, පවුල් ගැටුම්, පවුල් පරිසරය